**බදුල්ල මහා නගර සභාව - 2023**
**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බදුල්ල මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බදුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලිය රු.3,531,996ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ස්ථාවර තැන්පත් පොලී ලැබීම් කල් පිරෙන දිනය අනුව ආදායම් වියදම් ගිණුමට ගැලපීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ කඩා ඉවත්කර තිබුණු ක්‍රීඩා සමාජ ගොඩනැගිල්ලේ වටිනාකම රු.6,800,000 ක් ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි. | 2024 ගිණුම් පිළියෙල කිරීමේදී ජංගම නොවන වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී වැඩ නිම නොකළ සහ ගෙවීම් සඳහා ඉදිරිපත් නොවුණු කර්මාන්ත 09කට අදාළව රු.27,093,067 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ණයහිමියන් තුළ දක්වා තිබුණි. | අයහපත් කාලගුණය හේතුවෙන් වැඩ නිම කර ගැනීමට අපහසු වූ බවත් දෙසැම්බර් 31 දිනට කාලය දීර්ඝ කිරීම් අනුමත කර ඇති බව. | -එම- |
| (ඈ) | ගෙවිය යුතු පාර්ශව හඳුනාගෙන නොතිබුණු ආදායම් ආධාර රු.33,448,817 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | 2024 වර්ෂයේ සිට ආදායම් වියදම් ගිණුමට ගැලපීමටත් පෙර වර්ෂවල හිඟය 2024 ගිණුමේදී ගැළපීමට කටයුතු කරන බව. | -එම- |
| (ඉ) | ඉකුත් වර්ෂයේ හිඟහිටි මුද්දර ගාස්තු අඩුවෙන් දැක්වීමේ වරද නිවැරදි කිරීමේදී රු.983,006 ක් වැඩියෙන් සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | 2024 අවසන් ගිණුම මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඊ) | ඉකුත් වර්ෂ වලට අදාළව දුම්රිය මූලස්ථානයට ගෙවීම් කර තිබුණු හිඟ බදු මුදල වූ රු.9,872,386 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | ඉදිරියේදී හිඟ මුදල් ගෙවීම් සමුච්චිත අරමුදලට ගැලපීමට කටයුතු කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (උ) | ඉකුත් වර්ෂ වලට අදාළව හිඟ විදුලි බිල්පත් වටිනාකම වූ රු. 4,261,603 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

## 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 03කට පෙර සිට පැවත එන රු.1,892,710 ක අගරු චෙක්පත් තහවුරු කර ගැනීමකින් තොරව ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | වටිනාකමට අදාළ තොරතුරු නිරාකරණය කර විගණනය දැනුවත් කිරීමට කටයුතු කරන බව . | අගරු චෙක්පත් ශේෂය කඩිනමින් මූල්‍ය ප්‍රකාශනවල නිරවුල් කළයුතුය. |

## 1.7 අනුකුල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළ මනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 180 වගන්තිය | සමාලෝචිත වර්ෂයේදී පොදු වැසිකිළි 02ක් රු.9,723,000 ක ලංසුවකට සේවකයින් දෙදෙනෙකුගේ භාර්යාවන්ට ලබාදී තිබුණි. | අදාළ ලංසු ප්‍රදානය සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් මූලික විමර්ශන කටයුතු සිදු කරන බව. | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 31,680,800 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.40,985,192 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

## 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නාගරික කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 24,260,000 | 17,334,936 | 17,152,036 | 182,900 | 24,960,000 | 13,732,830 | 7,595,197 | 6,137,633 |
| (ii) | කුලී | 53,370,600 | 65,078,357 | 59,850,473 | 5,227,884 | 54,318,701 | 54,439,651 | 47,963,609 | 6,476,042 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 20,395,000 | 20,333,356 | 19,403,331 | 930,025 | 19,122,500 | 18,736,414 | 17,376,264 | 1,360,150 |
| (iv) | වෙනත් | 6,500,000 | 10,094,160 | 10,094,160 | 0 | 18,348,000 | 15,755,208 | 12,235,655 | 3,519,553 |
| | එකතුව | 104,525,600 | 112,840,809 | 106,500,000 | 6,340,809 | 116,749,201 | 102,664,103 | 85,170,725 | 17,493,378 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හිඟහිටි කාලය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණු හිඟහිටි වරිපනම් රු.17,436,125 ක්, හිඟහිටි වෙළඳසැල් කුලී රු.2,745,130ක් සහ හිඟ ටෙන්ඩර් මාළු කඩ කුලී රු.68,020ක් අයකරගෙන නොතිබුණි. | දෙසැම්බර් 31දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය වූ රු.18,283,037.91න් රු.846,912.64 ක්, හිඟහිටි වෙළඳසල් කුලී ශේෂය වන රු.3,392,240/- කින් රු.647,110 ක් සහ හිඟ මාළු කඩ කුලී ශේෂය වන රු. 171,563/- කින් රු.103,543/- ක් 2024.03.31 දිනට අයකරගෙන ඇති බව. | හිඟහිටි ආදායම් අයකරගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු රු.51,433,762ක මුද්දර ගාස්තු ගෙන්වාගෙන නොතිබුණි. | හිඟ මුද්දර ආදායමින් රු.9,594,100/- ක මුදලක් 2024.03.31 දිනට ලැබී ඇති බව. | හිඟහිටි මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගත යුතුය. |
| (ඇ) | මහා නගර සභාවට අයත් බදුල්ල මධ්‍යම බස් නැවතුම්පොළට ලංගම බස්රථ ඇතුල් කිරීමට 2014 දෙසැම්බර් 05 දින සිට 2019 දෙසැම්බර් 04 දක්වා වර්ෂ 05 ක කාලයක් සඳහා ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව අයවිය යුතු රු.2,177,500 ක ආදායම් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මහා නගර සභාව වෙත අයවිය යුතු මුදල අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

## 2.3 අධිභාර

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ 226 (1) වගන්තිය අනුව විගණකාධිපති විසින් 1994, 2004 සහ 2007 වර්ෂවලදී පනවා තිබුණු අධිභාර 03කට අදාළ රු.3,235,000 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් අයකරගෙන නොතිබුණි. | මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති බව. | අධිකරණ තීන්දුවලට අනුව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 ජනවාරි 25 දින සිට 2011 ඔක්තෝබර් 05 දක්වා කාල පරිච්ඡේදයට අදාළ පෞද්ගලික විදුලි පාරිභෝජනයන් හඳුනා නොගෙන රු.541,496 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | විදුලි බිල්පත් හිඟ මුදල 2023 වර්ෂයේ දෙසැම්බර් මස සිට සභා කම්කරුවන්ගෙන් අය කිරීමට පියවර ගෙන ඇති බව. | ගෙවීම් සිදු කිරීමේදී මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වලංගු කාලසීමාව ඉක්මවූ සංවර්ධන බලපත්‍ර 479 ක් සඳහා කාලය දීර්ඝ කිරීම හෝ ඉදිකිරීම් කටයුතු අවසන් කර අනුකූලතා සහතිකය ලබා දීමට කටයුතු කර නොතිබුණි. | ඉදිකිරීම් අවසන් වූ පසු අනුකූලතාවය ලබා ගැනීමට අයදුම්කරු දැනුවත් කර ඇති බව. | සංවර්ධන බලපත්‍රයේ කොන්දේසි පිළිබඳව පසුවිපරම් කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බදුල්ල මහා නගර සභාව විසින් භාවිතා කරනලද වෙනත් ආයතන නමට ලියාපදිංචි වී ඇති ගිලන් රථ 02 ක, ඩබල් කැබ් රථ 02 ක, ජල බවුසරයක, රෙස්කියු රථයක, කැබ් රථයක, කම්පැක්ටර් රථයක, ටිපර් ලොරි රථයක, සහ ට්‍රැක්ටර් රථ 02 ක අයිතිය මහා නගර සභාව වෙත පවරාගෙන නොතිබුණි. | වාහනවල ලියාපදිංචිය මහා නගර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | වාහනවල අයිතිය නිරවුල් කරගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | මහා නගර සභාවට අයත් යතුරු පැදි 02 ක් භෞතිකව විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | යතුරුපැදි 02 සම්බන්ධයෙන් සොයා බලා විගණන අංශය දැනුවත් කිරීමට කටයුතු කරන බව. | වගකිවයුතු පාර්ශවයන් හඳුනා ගෙන අලාභයන් අය කරගත යුතුය. |